PAUL RATNAYEKE ASSOCIATES
ATTORNEYS-AT-LAW
COLOMBO

<u>කොළඹ දිසා අධිකරණයේදීය.</u>

නිහාල් ශ්‍රී අමරසේකර,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

**පැමිණිලිකරු**

නඩු අංකය:21819/MR

- එදිරිව -

1. ගාමිණි ලක්ෂ්මන් පීරිස්,
**විසුම්පාය,** ස්ටෙපල්ස් වීදිය, කොළඹ 02.
සහ කිරුළ පෙදෙස, කොළඹ 05.

2. හොටෙල් ඩිවෙලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
කළම්බු හිල්ටන් ස්පෝට්ස් කම්ප්ලෙක්ස් බාරේ,
එච්ලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 01.

**විත්තිකරුවෝ.**

වර්ෂ 1999 ක්වූ ජනවාරි මස 22 වන දිනදීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයින් වූ **"පෝල් රත්නායක ඇසෝසියේට්ස්"** නම් නාමධාර විලාශයෙන් හවුල් ව්‍යාපාර කටයුතු කරන ජේම්ස් හෙන්රි පෝල් රත්නායක, උස්වත්ත ලියනගේ සුදත් නිලුපුල් ප්‍රසංස පෙරේරා සහ පුන්‍යකාන්ති නවරත්න සහ ඔවුන්ගේ සහායකයන් වන ශලින්ද්‍රි ජයසිංහ, ඉන්ද්‍රාලෝජිනී රාජගෝපාලන්, චන්ද්‍රානි සූර්යආරච්චි, අමාලි දීපානි අලව්ව, රුචිරා ඇන්තනී, සුරේනි වීරසිංහ ඉරේෂා ප්‍රනාන්දු, ගයාත්‍රි ප්‍රනාන්දු සහ චාමලී වීරසේකර යන නීතිඥවරුන් මඟින් පෙනී සිටින ඉහත නම සඳහන් **1වන විත්තිකරුගේ උත්තරයෙන්** මෙසේ කියා සිටියි:-

1. මෙහි මින්මතු ප්‍රකාශිතව ම පිළිගෙන ඇති ප්‍රකාශ හැර පැමිණිල්ලේ අඩංගු සියලුම හා එක් එක් ප්‍රකාශ 1වන විත්තිකරු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2. වෙනත් හේතු අතර වූ පහත දැක්වෙන හේතු නිසා, පැමිණිල්ල ප්‍රමාද දෝෂයකින් හාරගෙන ඇති බව සහ/හෝ පැමිණිල්ල ප්‍රතික්ෂේප කළ යුතු බව සහ/හෝ නඩුව නිෂ්ප්‍රභා කල යුතු බව 1වන විත්තිකරු කියා සිටියි:-

(අ) පැමිණිල්ලේ මුහුණත අනුව පැමිණිලිකරුගේ හිමිකම්පෑම සහ/හෝ නඩු නිමිත්ත කාලාපගමනය වී ඇත.

(ආ) වෙනත් දේ අතර පැමිණිල්ලේ දක්වා ඇති ප්‍රකාශ වලින් ව්‍යුත්පන්න නඩුවක් අනාවරණය නොවන නිසා පැමිණිල්ලෙන් 1වන විත්තිකරුට විරුද්ධව නඩු නිමිත්තක් අනාවරණය නොවේ.

(ඇ) පැමිණිල්ලේ මුහුණත අනුව, උද්දේශිත නඩු නිමිත්ත ඇත්තේ 1වන විත්තිකරුගේ නිල තත්තවයෙන් 1වන විත්තිකරුට විරුද්ධව ය.

3. මෙම අවස්ථාගත කරුණු අනුව පැමිණිල්ල ප්‍රත්ක්ෂේප කළ යුතු බව සහ/හෝ නඩුව නිශ්ප්‍රභා කල යුතු බව 1වන විත්තිකරු කියා සිටියි.

4. ඉහත කී කරුණු වලට හානියක් නොමැතිව 1වන විත්තිකරු මෙහි මතු සඳහන් ආකාරයට පිළිතුරු දෙයි.

5. පැමිණිල්ලේ 1වන ඡේදයට පිළිතරු දෙන 1වන විත්තිකරු ඔහුගේ පදිංචිය සහ 2වන විත්තිකරුගේ ලියාපදිංචි කාර්යාලය පිළිගන්නා නමුත් එහි අඩංගු අනිකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

6. පැමිණිල්ලේ 2වන ඡේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු පැමිණිල්ලේ 2(iii) වන ඡේදය පිළිගන්නා අතර පැමිණිල්ලේ 2(1) වන ඡේදයේ අඩංගු ප්‍රකාශ ගැන නොදනියි. ඒ නිසා ඔහු ඒවා ප්‍රතික්ෂේප කරයි.

7. පැමිණිල්ලේ 7(ii) වන ඡේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු, පැමිණිලිකරු මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු වූ බව පිළිගන්නා නමුත් එහි අඩංගු අනිකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

8. පැමිණිල්ලේ 3වන ඡේදයට පිළිතුරු දෙමින් :-

(i) 1වන විත්තිකරු, පැමිණිල්ලේ 3(i) වන ඡේදයේ සහ පැමිණිල්ලේ 3(iii) වන ඡේදයේ අඩංගු ප්‍රකාශ පිළිගනියි.

(ii) 1වන විත්තිකරු, පැමිණිල්ලේ 3(ii) වන ඡේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු, එක්සත් ජාතික පක්ෂය මේ රටේ ආණ්ඩුව පිහිටුවා තිබූ කාලයේ ඔහු ජනසවිය භාර අරමුදලේ උප සභාපති, තරුණ කටයුතු පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවේ, නීති කොමිෂන් සභාවේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාජකයකු වූ බව පිළිගනියි. 1වන විත්තිකරු එහි අඩංගු අනිකුත් ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

9. (i) පැමිණිල්ලේ 4වන ඡේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු 2වන විත්තිකාර සමාගම නිසි ලෙස සංස්ථාගත කරන ලද්දා වූද, කොළඹ කොටස් හුවමාරු පොලේ ලැයිස්තුගත කර ඇත්තා වූද පොදු සමාගමක් බව ද **කළම්බු හිල්ටන්** යනුවෙන් දන්නා හෝටලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල ඊට අයිති බව ද පිළිගනියි.

(iii) 1වන විත්තිකරු 2වන විත්තිකාර සමාගමේ කොටස් ප්‍රාග්ධනය ගැන නොදන්නා නමුත් ශ්‍රී ලංකා රජයට කොටස් බහුතරයක් අයිති බව දනියි.

10. (i) 1වන විත්තිකරු පැමිණිල්ලේ 4(ඇ) ඡේදයේ අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ අනුව ඒවා ප්‍රතික්ෂේප කරයි.

(ii) පැමිණිල්ලේ 4(ඇ) ඡේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු 2වන විත්තිකාර සමාගම විසින් මුදල් ආපසු ගෙවීමට ඇප වෙමින් ගිවිසුමක් අත්සන් කර ඇති වග දන්නා බව ප්‍රකාශ කරයි.

11. පැමිණිල්ලේ 7වන සහ 8වන ජේද වලට පිළිතුරු දෙන 1වන විත්තිකරු, වෙනත් දේ අතර පැමිණිලිකරු විසින් කරන ලද නියෝජන මත සමථයක් ගිවිසගත් බව ද මේ විත්තිකරු විසින් පුවත්පත් සාකච්ඡාවකදී මේ සමථය නිවේදනය කර ඇති බව ද ප්‍රකාශ කරයි.

12. ඉහත සඳහන් කරුණු වලට සහ හැන්සාඩ් වාර්තාවේ ප්‍රකාශ කර ඇති දෙයට යටත්ව 1වන විත්තිකරු පැමිණිල්ලේ 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19 සහ 20 වන ජේද වල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

13. 1වන විත්තිකරු පැමිණිල්ලේ 21 සහ 22 වන ජේද වල අඩංගු ප්‍රකාශ ගැන නොදන්නා අතර ඒ අනුව ඒවා ප්‍රතික්ෂේප කරයි.

14. පැමිණිල්ලේ 23 වන ජේදයට පිළිතුරු දෙන 1වන විත්තිකරු, ඩී.වයි.ලියනගේ 2වන විත්තිකාර සමාගමේ සභාපති වශයෙන් ක්‍රියා කරන බව 1වන විත්තිකරු දන්නේ යයි ප්‍රකාශ කරයි.

15. ඉහත සඳහන් කාරණාවලට යටත්ව 1වන විත්තිකරු පැමිණිල්ලේ 25 සිට 31 දක්වා ඇති ජේද වල අඩංගු ප්‍රකාශ ප්‍රතික්ෂේප කරයි.

**එමනිසා 1වන විත්තිකරු අයැද සිටින්නේ:-**

(අ) පැමිණිල්ල ප්‍රතික්ෂේප කරන ලෙස සහ/හෝ පැමිණිලිකරුගේ නඩුව නිෂ්ප්‍රභා කරන ලෙසත්,

(ආ) නඩු ගාස්තු ප්‍රදානය කරන ලෙසත්, සහ

(ඇ) මෙම අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ප්‍රදානය කරන ලෙසත්ය.

Paul Ratnayeke Associates

**1වන විත්තිකරුගේ ලේඛණගත නීතිඥවරු.**

**සකස් කරන ලද්දේ:**
හර්ෂ අමරසේකර,
නීතිඥ
රෝමේෂ් ද සිල්වා,
ජනාධිපති නීතිඥ